# කාර්යසාධන වාර්තාව

2
0
2
1

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: **සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

වැය ශීර්ෂ අංකය **:243**

## අන්තර්ගතය

**පරිච්ඡේදය**


1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම
3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
4. කාර්ය සාධන දර්ශක
5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
6. මානව සම්පත් පැතිකඩ
7. අනුකූලතා වාර්ත

**01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

## 1.1 හැඳින්වීම :

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. විධායක නිලධාරීන් 12 දෙනෙකු ප්‍රමුඛ 40 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

### 1.1.1 ප්‍රාථමික සංවර්ධන අංශය

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැඟී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

### 1.1.2 ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම්ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම්ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් බාණ්ඩයන් හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

### 1.1.3 සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබා දෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් සියයට 75 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 45 ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

### 1.1.4 සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්

නිෂ්පාදකයින්ට තම වගා බිමේ දී ලබා දෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳපොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහායන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම :**

"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රමුඛ නියෝජිත ආයතනය බවට පත්වීම".

**මෙහෙවර :**

"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම""

**අරමුණ :**

"සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නඟා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී".

## 1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.2 වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

1.3.3 ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.4 වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

1.3.5 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


1.3.6 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

1.3.7 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මගින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

1.3.8 රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

1.3.9 රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

## 1.4 සංවිධාන සටහන




- *නි.අ* – නියෝජ්‍ය අධ්‍යක්ෂ
- *ස.අ* – සහකාර අධ්‍යක්ෂ
- තො.ස.හා තා.නි. - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී
- ස.නි. සංවර්ධන නිලධාරී
- ප්‍ර.ක.සේ.නි. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
- තො.ස.හා තා. ස. - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර
- ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
- *ක.ස.* - කළමනාකරණ සහකාර
- *රිය* - *රියදුරු*
- කා.කා.ස. කාර්යාල කාර්ය සහායක

**1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/~~දිස්ත්‍රික්ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල.~~**

1. ප්‍රාථමික සංවර්ධන අංශය
2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

**1.5. ~~අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු~~/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/~~දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල.~~**

1. ප්‍රාථමික සංවර්ධන අංශය
2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය
3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය
4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්
5. විශේෂ කාර්යයන්/ව්‍යාපෘත

**1.6 ~~අමාත්‍යාංශ~~/දෙපාර්තමේන්තුව/~~පළාත් සභාව යටතේ පවතින ආයතනය~~/අරමුදල්**

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)**

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මිලියන) | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | ආසියානු සංවර්ධන බැංකුව | 61,213 | 2016-2024 |
| වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය | | 9,415 | 2019-2022 |

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- COVID 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් ඇති වූ පුරෝකථනය කළ නොහැකි ආකාරයේ සෘනාත්මක බලපෑමක් 2020 වසරේ සිට අඛණ්ඩව පැවති අතර එය 2021 වසරේ දී ද ආර්ථිකයේ සෑම අංශයකටම බලපාන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් එහි කාලානුරූපීව වෙනස් වීම අඩුවීම හේතුවෙන්ම මෙම වසංගතයෙන් වඩාත් පීඩාවට පත් වූ අංශයන්ගෙන් එකක් බවට පත්විය. එබැවින්, රජය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ආධාර වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායගේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ඔවුන්ගේ මූල බර ලිහිල් කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති වෙනස්කම් හා මූල්‍ය ආධාර සැපයීමට කඩිනම් පියවර ගන්නා ලදි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතනයක් ලෙස රාජ්‍ය නව ප්‍රවේශයන්ට අනුව සංවර්ධන මූල්‍ය දෙපාරතමේන්තුව විසින් 2021 වසරේ දී ප්‍රතිපත්ති සංශෝධනයන් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා සහය වීමේ වැඩසටහන් සිදු කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා සහාය වන ප්‍රධාන ව්‍යාපෘතියක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELC) 2021 වර්ෂයේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මෙම ණය යෝජනා ක්‍රමය මූලික සංරචක තුනකින් සමන්විත වේ. එනම්, කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය ප්‍රදානය (We - Fi) සමග සම්බන්ධ වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය (SME), කොවිඩ් වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ස්ථාවර කාරක ප්‍රාග්ධන පහසුකම් සපයනු ලබන කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර ණය පහසුකම (ERC) හා කුඩා තේ වතු හිමියන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය වේ.

- 2021 වර්ෂයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය යටතේ ආසන්න වශයෙන් රු. මිලියන 1,900 ක් ව්‍යවසායකයින් 192 ක් වෙත ආයෝජන ණය වශයෙන් ලබාදුන් අතර රු. මිලියන 128 ක් කාන්තා ව්‍යාවසායකයින් 112 ක් සඳහා ආයෝජන ණය වශයෙන් කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ප්‍රදානය (We - Fi) යටතේ ලබාදෙන ලදී. එයට අමතරව, 2021 වර්ෂයේ දී, කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර ණය පහසුකම යටතේ කොවිඩ් ව්‍යසනයේ බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 2,107 ක් යළි නගා සිටුවීම සඳහා රු. මිලියන 11,300 කට ආසන්න මුදලක් කාරක ප්‍රාග්ධන ණය ලෙස ලබාදෙන ලදී. කෘෂි හා කෘෂි ආශ්‍රිත නිෂ්පාදන, කර්මාන්ත, සංචාරක, පශු සම්පත්, ධීවර වැනි ආර්ථිකයේ ප්‍රමුඛ අංශ වෙත මෙම මූල්‍ය පහසුකම් සැපයීම සිදු කෙරිණි.

- නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ කුඩා ත්තේ වතු හිමියන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය යටත්තේ ත්තේ අළුතින් වගා කිරීම, තේ නැවත වගා කිරීම, වාරිපහසුකම් ලබාදීම, පැල තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය යනාදිය සඳහා කුඩා තේ වතු හිමියන් 330 දෙනෙකුට රු. මිලියන 551 ක ණය පහසුම් ලබා දී තිබේ. ඒ අතරින් 2021 වසරේ දී කුඩා තේ වතු හිමියන් 265 දෙනෙකු සඳහා තේ අළුතින් වගාව හා නැවත වගාව වෙනුවෙන් ණය ප්‍රදානයන් ද ලබා දුනි. ලබාදුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 56 ක් ත්තේ නැවත වගා කිරීම වෙනුවෙන් සහ සියයට 27 ක් තේ අළුතින් වගා කිරීම වෙනුවෙන් සපයා ඇත.

- පරිසර හිතකාමී ලෙස අඩු වියදමක් යටතේ බලශක්ති ප්‍රභවයන් කළමනාකරණය කිරීම සඳහා පොසිල ඉන්ධනවල සිට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වෙත විතැන් වීමේ

අරමුණින් සංවරධන මුල දෙපාරතමේන්තුවේ සෘජු මැදිහත්වීම යටතේ ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ වහලය මත සවිකරන ලද සූර්ය බල පද්ධති මගින් සූර්ය බල උත්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. 2018 වසරේ ව්‍යාපෘතිය ආරම්භයේ දී ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 50 ක් ලබා දීමේ මූලික අරමුණ සහිතව ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ. ඩොලර් මිලියන 50 ක් ලබාදෙන ලදී. 2021 වසර අවසාන වන විට රු. මිලියන 9,415 ක් ප්‍රතිලාභීන් 5,449 දෙනෙක් වෙත ලබා දෙමින් ව්‍යාපෘතියේ සම්පූර්ණ අරමුදල සාර්ථකව උපයෝජනය කර ඇති අතර එමගින් ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 70 ක් එක්කරමින් සියයට 140 ක භෞතික කාර්ය සාධන ඉලක්කයක් සපුරා තිබේ.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් තම ආයෝජන සඳහා අවශ්‍ය අරමුදල් බැංකු මගින් ලබාගැනීමට යාමේ දී බැකු විසින් ඉල්ලා සිටින ඇපකර සපුරාලීමට නොහැකි වීමෙන් මුහුණ දෙන අපහසුතාවන්ට තිරසාර විසඳුමක් ලෙස රජය විසින් ජාතික ණය ඇපසුරැකුම් ආයතනය පිහිටුවීමට දැනටමත් පියවර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ආයතනය 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ සීමා සහිත පොදු සමාගමක් ලෙස රාජ්‍ය බැංකු සහ බැකු නොවන මූල ආයතනවල මූලධන දායකත්වයෙන් ආසියානු සංවර්ධන බැංකුව සමග එක්ව ස්ථාපිත කෙරේ. ඒ අනුව යමින්, 2021 වර්ෂය අවසාන වන විට සුදුසුකම් සපුරන ලද සහභාගිත්ව මූල්‍ය ආයතන 20 ක් මෙම ආයතනයේ ආරම්භක ආයෝජකයින් ලෙස තෝරා ගෙන ඇත.

- 2021/22 මහ කන්නයේ වී වගාව සඳහා අවශ්‍ය පොහොර අවශ්‍යතාවය පරිසර හිතකාමී පොහොර මගින් කළමනාකරණය කර ඇත. කාබනික පොහොර භාවිතය ක්‍රියාවට නැංවීමේ පියවරක් ලෙස රු. මිලියන 9,317 ක වටිනාකමින් යුත් කොපෝස්ට්, දියර පොහොර හා ජෛව පොහොර ස්වරූපයෙන් පොහොර සැපයීමට හැකි පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කරනු ලබන තෝරාගත් දේශීය නිෂ්පාදකයින් සමග ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන ලදී. ඒ අනුව, රටේ පොහොර අවශ්‍යතාවය සපුරාලීමට සහය වීම සඳහා තෝරාගත් පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කරනු ලබන නව නිෂ්පාදකයින් 17 දෙන්නෙකුට අත්තිකාරම් මුදල් ලෙස රු. මිලියන 787 ක් ලබාදෙන ලදී. ඊට අමතරව, 2021/22 මහ කන්නයේ වී වගාව සඳහා වන පොටෑසියම් හා නයිට්‍රජන් අවශ්‍යතාව සපුරාලීම සඳහා පොටෑසියම් ක්ලෝරයිඩ් මෙ. ටො. 30,000 සහ නැනෝ නයිට්‍රජන් ලීටර් 153,227 ක් ආනයනය කරනු ලැබීය.

- එමෙන්ම, තම වගාව සඳහා අවශ්‍ය කාබනික පොහොර තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන ගොවීන්ට හෙක්ටයාර් එකකට රු. 12,500 ක් වන සේ උපරිමයක් හෙක්ටයාර් දෙකක් දක්වා ලබා දීමට තීරණය කරන ලදී. ඒ වෙනුවෙන්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත රු. මිලියන 5,800 ක් මේ වන විටත් ලබා දී තිබේ. කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම පිණිස, හරිත කෘෂිකාර්මික යෙදවුම් භාවිතා කිරීම හේතුවෙන් තම අස්වැන්න අඩු වූ වී ගොවීන්ට වන්දි ලබා දීමට ද රජය විසින් තීරණය කරන ලදී. එසේම, වී අලෙවි මණ්ඩලය මගින් මිල දී ගනු ලබන වි කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 90/- ක අවම මිලක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේවෙතත්, 2022 වර්ෂයේදී රජය විසින් කාබනික පොහොර ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.

  අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා පොහොර සහනාධාර වැඩසටහන වෙනුවට නිෂ්පාදනය මත පදනම් වූ දිරිගැන්වීමක් ලබාදීමට රජය විසින් යෝජනා කරන ලදී. මේ සමගම, අනෙකුත් ක්ෂේත්‍ර බෝග සඳහා අවශ්‍ය පොහොර තරඟකාරී වෙළඳපොළ මිලකට විවෘත වෙළෙඳපොළෙන් ගොවීන්ට මිල දී ගත හැකි විය.

- 2021.04.27 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, කාබනික පොහොර නිෂ්පාදකයින්ගේ හා කාබනික පොහොර භාවිතයට අනුගතවන ගොවීන්ට අවශ්‍ය සහනාධාර ලබාදීම ඇතුලත්ව අමාත්‍ය මණ්ඩල යෝජනාවේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් මහා භාණ්ඩාගාරය වෙත ලබාදෙන ලදී. ඒ අනුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග එක්ව කාබනික පොහොර, පළිබෝධනාශක සහ වනායක නිෂ්පාදකයින් සඳහා වාර්ෂික පොලී අනුපාතය 83 ක් වන විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව, කාබනික පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක නිෂ්පාදනය සඳහා සුදුසුකම් ලත් දේශීය නිෂ්පාදකයින් 22 වෙනුවෙන් රු. මිලියන 137.5 ක් උක්ත බැංකු තුන විසින් ලබා දී ඇත.

- කොවිඩ් වසංගත කාලය තුළ රටෙහි ආහාර සුරක්ෂිතතාවය සඳහා සැලකිය යුතු ලෙස බාධා ඇති විය. එබැවින්, 2020 - 2021 කාලය තුළ දී රටෙහි ආහාර සුරක්ෂිතතා මට්ටම කළමනාකරණය කිරීම වැදගත් විය. 2011 වසරේ දී රට තුළ වී වගාව සඳහා පහසුකම් සැලසීමට රජය වැඩි අවධානයක් යොමු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, රජය විසින් වී වගාව වෙනුවෙන් වැඩි අවදානයක් යොමු කළ අතර වී වගාවට අවශ්‍ය යෙදවුම් බෙදාහැරීම හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා එනම්, පොහොර බෙදාහැරීම, බීජ වී සැපයීම, වාරි පහසුකම් සැපයීම හා ව්‍යාප්ති සේවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවදානය යොමු කරන ලදී. වී වගාව කිරීමට ගොවීන් දිරිගැන්වීම සඳහා සාමාන්‍යයෙන් වගාකරන වී සඳහා සහතික මිලක් පවත්වාගෙන යන අතරම වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ද මෙම උපායමාරගය භාවිතා කරන ලදි.

- 2021 වසරේ රජය විසින් වී මිල දී ගැනීම වෙනුවෙන් නියම කළ සහතික මිලට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ මිලකට පෞද්ගලික අංශය විසින් වී මිල දී ගන්නා ලදී. එබැවින්, බැංකු අංශය හරහා අවශ්‍ය අරමුදල් ලබාදෙමින් පෞද්ගලික අංශයේ වී මිල දී ගැනීමේ ක්‍රියාවලියට රජය සහය පලකල අතර 2021 වර්ෂයේ පෞද්ගලික අංශය විසින් වී මිල දී ගැනීමේ වැඩසටහනේ දී භාවිතා කරනු ලැබූ ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය ද එය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වී මිල දී ගැනීම වෙනුවෙන් 2021 වසරේ පෞද්ගලික අංශය වෙත රජයේ හා පෞද්ගලික අංශයේ බැංකු මගින් ලබාදුන් ණය ප්‍රමාණය හා ණය මුදල් වටිනාකම 2020 වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 33 කින් හා සියයට 60 කින් ඉහළ ගොස් ඇත.

- පහළ හා මැදි ආදායම් ලබන ශ්‍රම බලකායට නිවාස සංවර්ධන අධිකාරිය (UDA), නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය (USDA), ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) මගින් ඉදිකරනු ලබන නිවාස සංකීර්ණයන්හි නිවාස ඒකකයක් මිල දී ගැනීමට සහය වීම සඳහා 2021 වසරේ අයවැය යෝජනාවක් අනුව "සොඳුරු කැදැල්ල" නිවාස ණය යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදී. ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රජයේ බැංකු මගින් සහනදායී පොලී අනුපාතයන් යටතේ ණය පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය මෙහෙයුම් මාරගෝපදේශ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලදී.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ එෆ්

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2021 රු. | | සටහන | තත්‍ය 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | |
| - | ජාත්‍යන්තර වෙළදාම මත බදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 36,391,751,969 | 69,652,175,495 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 91,525 | 534,945 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 4,597,091 | 4,322,850 | ඒසීඒ -5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **36,396,440,585** | **69,657,033,291** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ මුළු ආදායම් නොවන ලැබීම් ඇ= (අ) + (ආ)** | | **36,396,440,585** | **69,657,033,291** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ =(ඇ)-(ඈ)** | | **36,396,440,585** | **69,657,033,291** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ -2(ii) |
| 48,900,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 40,101,482 | 38,983,334 | |
| 798,550,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 706,860,349 | 10,329,967 | |
| 36,302,700,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 35,291,279,934 | 69,238,257,650 | |
| - | පොලී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - | |
| 37,150,150,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **36,038,241,765** | **69,287,570,951** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **10** | 422,015 | | |
| 30,600,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 1,194,064 | 17,251,165 | |
| 1,100,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 988,690,896 | 1,094,876,774 | **ඒසීඒ -2(ii)** |
| 18,180,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | 18,000,832,439 | 13,738,408,212 | |
| 200,000 | හැකියා වර්ධනය | **14** | 139,491 | 75,638 | |
| 12,390,000.00 | වෙනත් මූලධන වියදම් | **15** | 7,377,278 | 7,694,140 | |
| 19,324,290,000.00 | **මුළු මූලධන වියදම් (උ)** | | **18,998,656,183** | **14,858,305,929** | |
| | **තැන්පතු ගෙවීම්** | | 503,282 | 16,164,578 | **ඒසීඒ -4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 5,307,115 | 3,551,934 | **ඒසීඒ -5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 5,810,397 | 19,716,512 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 55,042,708,345 | 84,165,593,393 | |
| | **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ - එ)** | | (18,646,267,760) | (14,508,560,102) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (18,646,267,760) | (14,508,560,102) | **ඒසීඒ-7** |
| | **2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |
| - | | | **(18,646,267,760)** | **(14,508,560,102)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

### 2021 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,713,683,520 | 1,712,245,303 |
| | | - | - |
| **මූල්‍ය වත්කම්** | | - | - |
| | | - | - |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/ 5(ඒ) | 7,657,377 | 6,947,352 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **1,721,340,897** | **1,719,192,655** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 7,334,520 | 6,212,738 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,713,683,520 | 1,712,245,303 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5 (බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 322,857 | 734,614 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **1,721,340,897** | **1,719,192,655** |
| | | - | - |

පිටු අංක 6 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහි දී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | සහකාර අධ්‍යක්ෂ (මුදල්) |
| නම : එස්.ආර්.ආටිගල | නම : .කේ.පී.කේ.විමලවීර | නම :ඩබ්ලිව්.පී.බී.එස් අබේවර්ධන |
| තනතුර : ලේකම්, මුදල් අමාත්‍යාංශය | තනතුර: අධ්‍යක්ෂ ජනරාල් | තනතුර: සහකාර අධ්‍යක්ෂ (මුදල්) |
| දිනය: 22/2/22 | දිනය : 22/02/2022 | දිනය : 22/02/2022 |
| එස්. ආර්. ආටිගල<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් | ගීතා විමලවීර<br>අධ්‍යක්ෂ ජනරාල්<br>සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | [illegible] |

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - සී**

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2021<br>රු. | තතය<br>නැවත ගලපන ලද<br>2020<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ශීර්ෂ වලින් එකතු කරන ලද ආදායම් | 2,174,249 | 17,598,920 |
| අග්‍රිම ලැබීම | 36,391,751,969 | 69,652,175,495 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 2,477,557 | 1,695,759 |
| තැන්පතු ලැබීම් | 91,525 | 534,945 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **36,396,495,300** | **69,672,005,119** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 747,554,557 | 49,713,290 |
| සහනාධාර සහ මාරුකිරීම් | 35,216,913,485 | 69,168,824,465 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | 1,107,363 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | |
| අත්තිකාරම් ගෙවීම් | 2,774,199 | 1,969,964 |
| තැන්පතු ගෙවීම් | 503,282 | 16,164,578 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **35,967,745,523** | **69,237,779,659** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)** | **428,749,777** | **434,225,460** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 428,749,777 | 434,225,460 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **428,749,777** | **434,225,460** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(428,749,777)** | **(434,225,460)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **0** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | **0** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **0** | **-** |

### 3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

**වාර්තා කිරීමේ පදනම**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැණිම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්ම් විශවසනීයව මැණිය හැකි නම් එම වත්ම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාළ නොවේ | | | | | |

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.

රු. 000

| ප්‍රතිපාදන වර්ග | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 11,784,650,000.00 | 37,150,150,000.00 | 36,038,241,765.37 | 97% |
| ප්‍රාග්ධන | 18,144,290,000.00 | 19,324,290,000.00 | 18,998,656,182.66 | 98 % |

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල %ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | අදාළ නොවේ | | | | | |
| | | | | | | |

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 39,428,707.31 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 1,674,254,812.94 | | |
| 9180 | බදු දෙන ලද වත්ක | | | | |

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
| ඊපිඩී/බී/ඩීඩීඑෆ්/2/21/50 | | 2022 ජුනි 30 දින |

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ලේකම් කාර්යාලය
30 JUN 2022
Department of ...
Secretariat Building
...
கொழும்பு - ...

අධ්‍යක්ෂ ජනරාල්

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමග එවමි.

ඩී.ඒ.ඒ. වනිගසේකර

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : (1) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

(2021 නොවැම්බර් 26 දිනැති 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 9.2 ඡේදය ප්‍රකාරව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවා ඇත)

(2) ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය (කා.දැ.ස)

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } පීඩී/බී/ඩීඩීඑෆ්/2/21/50 | මබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 ජූනි 30 දින |

ගණන්දීමේ නිලධාරී

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මතය**

ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අක් මුදල් ගැලපුම් ගිණුම

2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාල ACA – 6 හා ACA – 7 ආකෘති සංශෝධනය කර තිබුණි. 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය සෘණ රු.18,646,267,760 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ රු.18,646,267,760 ක් වී ඇත. එම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය සමඟ ගැලපූ විට එය සෘණ රු.37,292,535,520 ක් වේ. නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය ධන රු. 18,646,267,760 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත ACA 7 ආකෘතිය නිවැරදි ලෙස ඉදිරිපත් නොකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති සටහන් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ලෙස තාර්කික ලෙස ඉදිරිපත් වී නොතිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

පුනරාවර්තන වැය විෂයන් 08 ක් හා මූලධන වැය විෂයන් 07 ක් සඳහා එකතුව රු.648,652,500 ක අධි ප්‍රතිපාදන සැලසීම නිසා එම ප්‍රතිපාදනයෙන් එකතුව රු.307,337,639 ක් පමණක් උපයෝජනය කිරීම නිසා එකතුව රු.341,314,861 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව එක් එක් වැය විෂය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක සිට සියයට 98 ක් දක්වා ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

මුදල් පොත පවත්වා ගෙන යාම, චෙක්පත් ලිවීම, ගෙවීම් කිරීම හා මුදල් බැංකු බැංකුවේ තැන්පත් කිරීම යන සියළුම කාර්යයන් එකම නිලධාරියෙකු විසින් ඉටු කිරීම නිසා එහි අභ්‍යන්තර පරීක්ෂාව දුර්වල වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) “සිගිති” පාසල ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 62 දෙනෙකු වෙත රු.මිලියන 63 ක් ලබා දී තිබුණි. එම ණය යොජනා ක්‍රමය යටතේ ලබාගත් ණය සඳහා වන පොළියෙන් සියයට 50 ක්

දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වෙත එකතුව රු.1,175,779 ක පොලියක් ගෙවිය යුතුව තිබුණි.

(ආ) "රැකවරණ" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් නව දෙනෙකු වෙත රු.මිලියන 44.4 ක් ලබා දී තිබුණි. එම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා වන පොළියෙන් සියයට 75 ක් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දිනට වාණිජ බැංකු වෙත එකතුව රු.2,290,831 ක පොළියක් ගෙවිය යුතුව තිබුණි.

(ඇ) "මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 729 දෙනෙකු වෙත රු.මිලියන 650.50 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය සඳහා පොළිය සියයට සියයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය රු.7,627,617 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඈ) "ඇරඹුම" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 175 දෙනෙකු වෙත රු.මිලියන 230.99 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළිය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.4,763,063.93 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඉ) "රිවි බල සවිය" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 453 දෙනෙකු වෙත රු.මිලියන 157.6 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.1,452,873 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඊ) "ජය ඉසුර" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,000 දෙනෙකුට රු.මිලියන 21,357.4 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.934,728,127 ක් ගෙවිය යුතුව තිබුණි.

(උ) "හරිත ණය" යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 242 දෙනෙකු වෙත රු.මිලියන791.5 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.28,165,682 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඌ) "දිරි සවිය" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 572 දෙනෙකු වෙත රු. මිලියන 413.3 ක් ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළිය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.12,848,075 ක් ගෙවිය යුතුව තිබුණි.

(එ) "රිය ශක්ති" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 178 දෙනෙකු වෙත රු. මිලියන 613.8 ක් ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.25,571,440 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඒ) "මාධ්‍ය අරුණ" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 258 දෙනෙකු වෙත රු. මිලියන 76.9 ක් ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළියය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.1,127,807 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඔ) "සංචාරක පොඩ්ඩෝ" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,198 දෙනෙකු වෙත රු. මිලියන 538.46 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන්වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.16,266,641 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඕ) "සිටි රයිඩ්" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 8 දෙනෙකු වෙත රු. මිලියන 52.1 ක් ලබා දී තිබුණි. මෙම ණය

යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු. 426,637 ක් ගෙවිය යුතුව තිබුණි.

(ක) "සොඳුරු පියස" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 14,834 දෙනෙකු වෙත රු. මිලියන 2,958.3 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.61,712,790 ක් ගෙවිය යුතුව තිබුණි.

(ග) "හෝම් ස්වීට් හෝම්" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,282 දෙනෙකු වෙත රු. මිලියන 4,585.2 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 56.7 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.99,262,678 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඝ) "සිහින මාලිගා" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 247 දෙනෙකු වෙත රු. මිලියන 1,332.5 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.4,541,908 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඞ) "රන් අසවැන්න" ණය යොජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 7,970 දෙනෙකු වෙත රු. මිලියන 11,469.3 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත හිඟහිටි පොළිය ලෙස රු.157,409,834 ක් ගෙවිය යුතුව තිබුණි.

(ම) 2015 අයවැය යෝජනාවක් අනුව 2017 වර්ෂයේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂ බලපත්‍රලාභී බැංකුවල රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොළී ප්‍රතිශතයක් ගෙවනු ලබයි. සාමාන්‍ය පොළී අනුපාතය හා ගෙවනු ලබන සියයට 15 ක පොළී ප්‍රතිශතය අතර වෙනසට අදාළ මුදල දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකුවලට ප්‍රතිපූර්ණය කිරීම සිදු කරනු ලබයි. එලෙස 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු හිඟ පොළිය රු. 50,964,760,952 ක් බව නිරීක්ෂණය විය.

**4. මානව සම්පත් කළමනාකරණය**

2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක.

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | 96% | | |
| වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය | 100% | | |
| කාන්තා ව්‍යවසායකත්ව මුල්‍ය ආධාර ක්‍රමය | 100% | | |
| තෝරාගත් කාබනික පොහොර නිෂ්පාදකයින් වෙත අත්තිකාරම් ගෙවීම | | 88% | |
| කුඩා තේ වතු හිමියන්ගේ ණය යෝජනා ක්‍රමය | 100% | | |
| කුඩා තේ වතු හිමියන් සඳහා ජේ එෆ් පී ආර් ප්‍රදාන සංරචකය | 100% | | |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකය | 100% | | |

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75% -100% |
| **අරමුණු 01** සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1 ආ) දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය | 1.ආ.1) ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් අසාධාරණයට ලක්වන කාන්තාවන්, දිළිඳු පුද්ගලයින් සහ | **ණය කපාහැරීමේ වැඩසටහන :** ණයගැතියන් සංඛ්‍යාව: 45,139 ක්ෂුද්‍රමුල්‍ය සමාගම්/මුල්‍ය සමාගම් විසින් කපා හරින ලද ප්‍රාග්ධන මුදල: රු. මිලියන 1,255.74 | | |

| | | | |
|---|---|---|---|
| | ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම. | අවදානම් කණ්ඩායම් වැනි අංශ සඳහා වන රජයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය. | ක්ෂුද්‍රමූල්‍ය සමාගම්/මූල්‍ය සමාගම් විසින් කපාහරින ලද පොලී මුදල : රු. මිලියන 141.41<br><br>මේ සඳහා රජය විසින් 2021 වසරේ දරණ ලද වියදම රු. මිලියන 418.58 කි. |
| **අරමුණ 02**<br>සාගින්න නැති කර ආහාර සුරක්ෂිතභාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 2.4) වසර 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාළගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාවට නැංවීම. | 2.4.3) ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය. | **නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව: 67,576<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර මුදල : රු. මිලියන 125.40<br>වගා කරන ලද භූමි ප්‍රමාණය : (අක්කර) 260,089<br><br>**"රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 7,970<br>ණය මුදල : රු. මිලියන 11,469.3<br>2021 වසරේ පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 718.78<br><br>**"ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,451<br>ණය මුදල : රු. මිලියන - 682.4<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 76.75<br><br>**ධාන්‍ය ගබඩා ඉදිකරීරීම**<br>අස්වැන්න බහුල කාලවල මිලෙහි ඇති වන පහත වැටීමෙන් ගොවීන්ට වන හානිය අවම කරමින් අස්වැන්න අඩු කාලවල දී ඉහළ මිලක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීමේ අරමුණින් වී, බඩඉරිඟු, සෝයා, තල, කව්පි, ගම්මිරිස්, රටකජු යනාදී ධාන්‍ය වර්ග ගබඩා කිරීම සඳහා අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චිය සහ පොලොන්නරුව යන ප්‍රදේශවල ඉදි කරන ලද ගබඩා 05 ක මෙහෙයුම් කටයුතු අධීක්ෂණය |

| | | | |
|---|---|---|---|
| | | | කිරීම.<br><br>**වී සහල් බවට පත් කිරීමේ වැඩසටහන**<br>වී අලෙවි මණ්ඩලය හා දිස්ත්‍රික් ලේක්ම්/දිසාපතිවරුන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් මඟින් රු. මිලියන 3,197 ක පිරිවැයක් දරමින් වී මෙ.ටො. 65,726 ක් මිලට ගෙන සහන මිලක් යටතේ සහල් මෙ. ටො. 34,821 ක් ලංකා සතොස ආයතනය හරහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ලදි. |
| **අරමුණ 04**<br>පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | 4.2) වසර 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සුදානම්ව සිටින බව තහවුරු කිරීම. | 4.2.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු. 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | **"සිගිති පාසල" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 62<br>ණය මුදල : රු. මිලියන 63.4<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 3.88<br><br>**"රැකවරන" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 9<br>ණය මුදල : රු. මිලියන 44.4<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 1.47 |
| | 4.7) වසර 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික | 4.7.1) ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම II. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් (අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (ආ) විෂය මාලාවන් (ඇ) ගුරු අධ්‍යාපනය සහ (ඈ) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම්වල දී ප්‍රවාහානුගතව පැවතීම ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම. | **"මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 729<br>ණය මුදල : රු. මිලියන 650.5<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 43.95<br><br>**"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 175<br>ණය මුදල : රු. මිලියන 230.99<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම : රු. මිලියන 20.51 |

| | | | |
|---|---|---|---|
| | විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | | |
| **අරමුණ 05**<br>ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1) කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලු ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | 5.1.1) ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම් ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න. | **කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 112<br>ණය මුදල : රු. මිලියන 127.60 |
| **අරමුණ 07**<br>සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | 7. ආ) වසර 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවල ඔවුන්ගේ වැඩසටහන් සැලසුම් වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කරීම. | 7. ආ 1) දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන. | **"රිවි බල සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 453<br>ණය මුදල : රු. මිලියන 157.6<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 13.34<br><br>**වහලය මත සවි කරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 5,449<br>ණය මුදල : රු. මිලියන 9,415.25 |
| **අරමුණ 08**<br>සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 8.3) ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් | 8.3.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය. | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 192<br>ණය මුදල : රු. මිලියන 1,908<br><br>**"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,000<br>ණය මුදල : රු. මිලියන 21,357.4<br>2021 වසරේ ගෙවන ලද පොලී |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම් සහ සංවර්ධනය කිරීම් දිරි ගැන්වීම. | | සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 1,487.64<br><br>**"හරිත ණය" යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 242<br>ණය මුදල : රු. මිලියන 791.5<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 39.99<br><br>**"දිරි සවිය" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 572<br>ණය මුදල : රු. මිලියන 413.3<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 9.80<br><br>**"රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 178<br>ණය මුදල : රු. මිලියන 613.8<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 148.00<br><br>**"මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 258<br>ණය මුදල : රු. මිලියන 76.9<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 15.02<br><br>**"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 1,198<br>ණය මුදල : රු. මිලියන 538.46<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 76.90<br><br>**"සිටි රයිඩ්" ණය යෝජනා ක්‍රමය** |

| | | | |
|---|---|---|---|
| | | | ණය සංඛ්‍යාව : 8<br>ණය මුදල : රු. මිලියන 52.1<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 3.08 |
| **අරමුණ 11**<br>නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1) 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම. | 11.1.1) පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය. | **"සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 14,834<br>ණය මුදල රු. මිලියන : 2,958.3<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 153.43<br>**"හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය :**<br>ණය සංඛ්‍යාව: 1,282<br>ණය මුදල රු. මිලියන : 4,585.2<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 204.76<br><br>**"සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය**<br>ණය සංඛ්‍යාව : 247<br>ණය මුදල රු. මිලියන : 1,332.5<br>2021 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 101.29 |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ආර්ථික සංවර්ධනයේ දී රටක් සතු ස්වභාවික සම්පත් වර්තමාන පරම්පරාව විසින් ප්‍රශස්ත ලෙස හා මනා කළමනාකාරීත්වයකින් යුක්තව භාවිතා කිරීම මගින් අනාගත පරම්පරාවට ද එම සම්පත් උරුම කර දීම තිරසර සංවර්ධනයේ මූඛ්‍ය පරමාර්ථය වේ. එවන් අරමුණක් පෙරදැරි කර ගනිමින් 2015 වසරේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සිය සාමාජික රටවල් 193 විසින් ක්ෂේත්‍ර 17 ක් ආවරණය වන පරිදි 2030 වසර වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 ක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව, මානව, සමාජ, ආර්ථික හා පාරිසරික යන ප්‍රධාන කුලුණු හතර සම්බන්ධ කරමින් පාරිසරික තිරසරභාවය, සමාජ තිරසරභාවය සහ ආර්ථික සංවර්ධනය යන අංශ ඔස්සේ අගය කරනු ලබන තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම මෙහි ප්‍රමුඛ පරමාර්ථය වේ. මෙකී තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් සහ ඉලක්ක වසර 2030 දී ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ සඳහා රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන හරහා මෙන්ම ජාත්‍යන්තර සංවිධාන මත පදනම්ව කටයුතු කරනු ලැබේ.

මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථවල ප්‍රමුඛතම හා පළමු පරමාර්ථය වන "සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම" සඳහා නිෂ්පාදනය වැඩිකිරීම වෙනුවෙන් ආයෝජනය වේගවත් කිරීමටත්, ඒ සඳහා ප්‍රමුඛත්වය අවශ්‍ය අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව වැඩි නැඹුරුවක් ලබාදෙමින් සංවර්ධන උපායමාර්ග මෙහෙයවීමත් වැදගත් වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී වැදගත් උපායමාර්ගික අංශයක් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වැදගත්කම හඳුනාගනිමින් ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය යාන්ත්‍රණයේ දායකත්වය ලබාදීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ඉලක්ක කරගනිමින් වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවා ඇත. එම වැඩසටහන් අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය හා කොවිඩ් වසංගතය නිසා බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබාදෙන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය ප්‍රමුඛ වැඩසටහන් වේ.

2016 වසරේ දී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ආරම්භ කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය මගින් ඇ.ඩො. මිලියන 175 ක් එම ව්‍යාපාරයන් හි ආයෝජන ඉහළ නැංවීම සඳහා ලබා දෙමින් 2020 වසර වන විට සාර්ථකව අවසන් කළ අතර එහි ඊළඟ අදියර 2021 වසරේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව, මෙම අදියර යටතේ ඇ. ඩො. මිලියන 65 ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවය පළ කළ අතර එයින් ඇ. ඩො. මිලියන 45 ක් දැනට ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය ඉදිරියට ගෙන යාමටත්, ඇ. ඩො. මිලියන 20 ක් කුඩා තේ වතු හිමියන්ට තේ නව රෝපණය, නැවත වගා කිරීම, බිම් සැකසීම සහ යාන්ත්‍රීකරණය සඳහා පහසුකම් සැපයීමට නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහාත් වෙන් කර ඇත. ඒ අනුව, 2021 වසර අවසන් වන විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන දහයක් විසින් ව්‍යවසායකයින් 192 ක් අතරේ රුපියල් මිලියන 1,908 ක මුදලක් ණය වශයෙන් ලබාදෙන ලදී. එම ණය මුදලින් වැඩිම ණය මුදල පිළිවෙලින් කෘෂිකර්මාන්ත, නිෂ්පාදන අංශය, සංචාරක් හා වෙනත් යන අංශ අතරේ ආසන්න වශයෙන් රු. මිලියන 402 ක්, 356 ක්, 245 ක් හා 173 ක් ලෙස ව්‍යවසායකයින් 143 දෙනෙකු අතරේ බෙදී යන ලදී.

එමෙන්ම, කොවිඩ් - 19 වෛරසය පැතිර යාමත් සමඟ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාව්‍යසායකයින්ගේ ක්ෂණික මූල්‍ය අවශ්‍යතා වැඩිවීමත්, ව්‍යාපාර බිඳවැටීම තුළින් ඇති වූ අහිතකර බලපෑම අවම කර සේවකයින්ගේ රැකි රක්ෂා සුරක්ෂිත කර ගැනීමත්, කඩාවැටුනු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නැවත සවිබල ගැන්වීම සඳහා එම ව්‍යාපාර වෙත කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය ලබාදීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකය," (SME Emergency Response Component) යටතේ ඇ.ඩො. මිලියන 100 ක් එනම් රු. මිලියන 19,348 ක මුදලක් ලබාදෙන ලදී. එලෙස ලබාදෙන ලද මුදලින් සියයට 59 ක් එනම් රු. මිලියන 11,365 ක මුදලක් ව්‍යවසායකයින් 2,107 දෙනෙක් අතරේ සහභාගීත්ව මූල්‍ය ආයතන 10 ක් විසින් ලබාදෙන ලද අතර එලෙස ලබාදුන් ණයවලින් සියයට 43 ක් ම ඇප සුරැකුම් රහිත ණය වශයෙන් ලබාදීම සුවිශේෂී තත්ත්වයකි.

තවද, තේ කර්මාන්තය ලංකාවේ ප්‍රමුඛ ආදායම් උත්පාදන මාර්ගයක් වන බැවින් හා ඒ සඳහා කුඩා තේ වතු හිමියන් විසින් දක්වන දායකත්වයේ වැදගත්කම හඳුනාගනිමින් කුඩා තේ වතු හිමියන්ට තේ නව රෝපණය, නැවත වගා කිරීම, බිම් සැකසීම සහ යාන්ත්‍රීකරණය සඳහා පහසුකම් සැපයීමට ක්‍රියාත්මක කරනු ලබන නියමු ව්‍යාපෘතිය වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින්

ඇ. ඩො. මිලියන 20 ක් ලබාදෙන ලද අතර 2021 වසර අවසන් වන විට රු. මිලියන 847 ක් මූල්‍ය ආයතන 10 ක් අතරේ බෙදාදෙන ලදී. තවද, ඇමරිකානු ඩොලර් මිලියන 0.5 ක් තේ නව රෝපණය හා තේ නැවත වගාව වෙනුවෙන් ණය ලබාගන්නන්ට ඔවුන් දිරිමත් කිරීමේ අරමුණින් අදාළ ණය මුදලින් සියයට 20 ක් නැවත නොගෙවිය යුතු ප්‍රදානයක් ලෙස හිමි වේ. කෙසේවෙතත්, වසර අවසන් වන විට මෙම රු. මිලියන 847 කට ආසන්න මුදලින් සියයට 70 කට ආසන්න මුදලක් වසර අවසන් වන විටත් උපයෝජනය කර ඇති අතර එම උපයෝජිත මුදලින් සියයට පනහකට වඩා වැඩි ප්‍රමාණයක් තේ නැවත වගාව වෙනුවෙන් ද, සියයට 23 ක ආසන්න ප්‍රමාණයක් තේ නව රෝපණය වෙනුවෙන් ද ආයෝජනය කිරීම අනාගත තේ නිෂ්පාදනය හා තේ ආශ්‍රිත අපනයන ඉහළයාමටත් එම ක්ෂේත්‍රය හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන්ගේ ආදායම ඉහළයාමටත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළයාමට මහගු පිටුවහලක් වනු ඇත.

"ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත්කර ගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම" තිරසර සංවර්ධන අභිමතාර්ථවල තවත් එක් වැදගත් පරමාර්ථයක් වේ. ඒ වෙනුවෙන් කෘෂි අංශයේ ආයෝජනය ප්‍රවර්ධනය කිරීම හා නිෂ්පාදන ගුණත්වය ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ. එමගින් සාගින්නෙන් පෙලෙන ජනතාව අවම කර ආහාර සුරක්ෂිතතාව හා වස විසෙන් තොර ඉහළ පෝෂණයෙන් යුත් ආහාර වේලක් අත්පත් කරගැනීමට අවකාශ හිමිවන අතර දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට පෝෂනයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීමට හැකි වනු ඇත. ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් වී මිල දී ගැනීමේ වැඩසටහන හා කාබනික පොහොර ලබාදීමේ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම තුළින් මෙම අරමුණ වෙනුවෙන් සක්‍රීයව දායකත්වය ලබාදෙනු ලබයි.

දේශීය නිෂ්පාදනය ඉහළ නැවීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් රජය විසින් ගොවීන් වෙත රසායනික පොහොර සහනාධාරය ලබාදෙනු ලැබුවද එමඟින් ඇති වූ නිදන්ගත රෝග ව්‍යාප්තිය, ස්වභාවික ජල පෝෂක අපවිත්‍රවීම වැනි විවිධ අතුරු ප්‍රතිවිපාක හේතුවෙන් රටතුළ අර්බුද රැසක් නිර්මානය වන්නට විය. එයට විසඳුමක් ලෙස රජය විසින් පසුගිය වසරේ අප්‍රේල් මස සිට සියළුම රසායනික පොහොර, පලිබෝධනාශක හා වල්නාශක ආනයන තහනම් කරන ලද අතර දේශීය කෘෂිකර්මාන්තය කාබනික පොහොර මත වන රැදියාව ඉහළ නැංවීමට සැලසුම් කරන ලදී. ඒ අනුව, 2021/22 මහ කන්නය සඳහා තමන් විසින්ම නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර භාවිතා කරමින් වී වගාවේ යෙදෙන ගොවීන් වෙත එලෙස නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර වෙනුවෙන් හෙක්ටයාර් එකකට රු. 12,500/- බැගින් උපරිමය හෙක්ටයාර් දෙකක් දක්වා වූ සහනාධාරයක් ලබාදීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදෙන ලදී. කාබනික පොහොර අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන දේශීය නිෂ්පාදකයින් වෙත ඒ සඳහා වන දිරි දීමක් ලෙස රු. මිලියන 787 ක් අත්තිකාරම් මුදලක් මෙම දෙපාර්තමේන්තුව හරහා ලබාදෙන ලදී. කෙසේවෙතත්, වී වගාව සඳහා දේශීය කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන නිසා නැනෝ නයිට්‍රජන් දියර පොහොර හා නයිට්‍රජන් අවශ්‍යතාවය සපුරාගැනීමට ස්වාභාවික පොටැසියම් ක්ලෝරයිඩ් ආනයනය කිරීමට ද තීරණය කරන ලදී.

එමෙන්ම, සත්ව ආහාර නිෂ්පාදනය සඳහා දේශීය බඩඉරිඟු නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන බැවින් තිරිඟු ඇට මෙ.ටො. 200,000 ක් සහ බඩඉරිඟු මෙ.ටො. 40,000 ආනයනය කිරීමට තීරණය කළ අතර පසුගිය වසරේ අවසන් වන විට තිරිඟු ඇට හා බඩඉරිඟු පිළිවලින් මෙ.ටො. 168,565 ක් හා 15,130 ක් ආනයනය කරන ලදී.

ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා සහල්, ධාන්‍ය හා එළවළු දැරිය හැකි මිලකට වෙළඳපොල තුළ සුලබ කිරීම පිණිස රජය 2021 වර්ෂයේ දී ද මැදිහත් විය. විශේෂයෙන්ම, කොවිඩ් - 19 වසංගතයේ බලපෑම හමුවේ රට තුළ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහළයාම හේතුවෙන් ජන ජීවිතයට වූ අහිතකර බලපෑම පාලනය කිරීමේ අරමුණින් රජය විසින් වෙළඳපොල මිල ඉහළයාම පාලනය සඳහා අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

ඒ අනුව, ජනතාවගේ ප්‍රධාන ආහාරය වන සහල්වල මිල ඉහළයාමෙන් පාරිභෝගික ජනතාවට සිදුවන අපහසුතාවය මගහැරවීම උදෙසා රජයේ සහතික මිල වැඩසටහන යටතේ වී මිල දී ගැනීමේ කටයුතු රජය විසින් 2021 වසරේ දී ද සාර්ථක ලෙස ක්‍රියාවට නංවන ලදී. වී අලෙවි මණ්ඩලය හා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් මඟින් රු. මිලියන 3,197 ක පිරිවැයක් දරමින් වී මෙ.ටො. 65,726 ක් මිලට ගෙන සහන මිලක් යටතේ සහල් මෙ. ටො. 34,821 ක් ලංකා සතොස ආයතනය හරහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ලදි.
එමෙන්ම, කොවිඩ් - 19 වසංගතයේ බලපෑම හමුවේ ආනයනික පරිප්පු මිල ඉහළයාම හේතුවෙන් ආනයනික පරිප්පු සඳහා ආදේශක ආහාරයක් වන දේශීය මුං ඇට සහන මිලට පාරිභෝගිකයින් වෙත ලබාදීම සඳහා ද රජය සෘජුවම දායකත්වයක් දක්වන ලදී. ඒ අනුව, අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, වවුනියාව, රත්නපුර හා පුත්තලම යන දිස්ත්‍රික්කවලින් රු. මිලියන 509 ක වැය බරක් දරමින් මුං ඇට  මෙ. ටො. 413 ක් මිල දී ගෙන ලංකා සතොස අලෙවි ජාලය හරහා කිලෝවක් රු. 225.00 ක් වැනි සහන මිලකට, පරිභෝගිකයන් වෙත අලෙවි කිරීමට කටයුතු යොදන ලදී. ඒ හරහා ඉහළ ගිය ජීවන වියදම හමුවේ පාරිභෝගිකයන් වෙත තම මූලික පෝෂණ අවශ්‍යතාව සපුරා ගැනීමේ අභියෝගයට සහායක් හිමි වූ අතර, එමඟින් ග්‍රාමීය ප්‍රදේශයන්හි මුං ඇට වගාකරුවන් වෙත ද තම නිෂ්පාදනයන්ට ඉහළ මිලක් හිමි වීම තුළ ඉහළ ගිය ජීවන වියදම කළමනාකරණයට ප්‍රමාණවත් ආදායමක් ද හිමි විය.

තවද, එළවළු මිල අධික ලෙස ඉහළයාම හේතුවෙන් නාගරික ජනජීවිතයට වූ අපහසුතාවයට පිළියමක් ලෙස එක් දිස්ත්‍රික්කයකට රු. මිලියන 3 බැගින් වූ ප්‍රතිපාදන යොදාගනිමින් ජන ඝනත්වය අධික  දිස්ත්‍රික්ක වන කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් සම්බන්ධ කර ගනිමින් එම දිස්ත්‍රික්ක තුළ සහන මිලට එළවළු අලෙවි කිරීමට කටයතු කරන ලදි. රජය විසින් දරන ලද මෙම සියළු ක්‍රියාමාර්ග තුළින් ග්‍රාමීය, අර්ධ නාගරික හා නාගරික කුටුම්භ වෙත පෝෂදායී ආහාර අඩු මිලට වෙළඳපොල තුළ සුලබ කිරීමට හැකි විය.

ස්ත්‍රී පුරුෂ සමානාත්මභාවය සනිටුහන් කර ගනිමින් කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබලගැන්වීම තිරසර  සංවර්ධන ඉලක්කවල තවත් ප්‍රමුඛ ඉලක්කයක් වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කාන්තාවන්ට ද විශාල වගකීමක් පවතින හෙයින් ඔවුන් ද සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම වැදගත් වන නිසා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ, " කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර  යෝජනා ක්‍රමය" (Women Entrepreneurship Initiative – We-Fi) ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, කාන්තාවන් හට තම දැනුම කුසලතා වර්ධනය කර ගනිමින් ව්‍යසායකයින් බවට පත්වීමට අවස්ථාව ලද අතර එමඟින් ඔවුන් කුටුම්භයේ ආදායමට මෙන්ම රටේ ආර්ථික වර්ධනයටත් දායකත්වයක් සපයමින් සිටී.

මෙම යෝජනා ක්‍රමය යටතේ කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා ඔවුන් තම ව්‍යාපාර ආරම්භ කිරීම හා දියුණු කිරීම වෙනුවෙන් ලබා ගන්නා ණය මුදලින් සියයට 10 ක මුදලක් නැවත නොගෙවිය යුතු ප්‍රදානයක් ලෙස ලබා දේ. පසුගාමී සංවර්ධිත ප්‍රදේශ වන උතුරු, නැගෙනහිර, ඌව හා සබරගමුව යන දිස්ත්‍රික්කවල කාන්තා ව්‍යවසායකයින් විසින් ලබා ගන්නා ණය මුදල් සඳහා වන මෙම ප්‍රදානය සියයට 15 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකු විසින් පවත් වන ලද කාන්තා ව්‍යවසායකත්ව පුහුණුව ලද ව්‍යවසායිකාවන් සඳහා සියයට 10 ක උක්ත ප්‍රදානයට අතිරේකව තවත් ණය ප්‍රදානයක් ලබා දේ. ඒ අනුව, පුහුණුව ලත් ණය ඉල්ලුම් කරනු ලබන කාන්තා ව්‍යවසායිකාවන් සඳහා සියයට 20 ක හා පසුගාමී සංවර්ධිත ප්‍රදේශවල ව්‍යවසායිකාවන් අදාළ පුහුණුව ලබා ඇත්නම් ඔවුනට සියයට 25 ක ප්‍රදානයක් හිමි වේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු ආයතන 10 ක් මඟින් මෙම ණය යෝජනා ක්‍රමය 2021 වසරේ දී ක්‍රියාවට නංවන ලද අතර එමඟින් කාන්තා ව්‍යවසායකයින් 112 දෙනෙක් අතරේ රු. මිලියන 128 ක් ප්‍රදානයන් ලෙස ලබාදෙමින් කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීමට ක්‍රියාකළ අතර මෙමගින් රට තුළ පවත්නා ස්ත්‍රී පුරුෂ ශ්‍රම විෂමතා අවම කරමින් රටේ සංවර්ධන කාර්යයට ඔවුන් ද ඵලදායී ලෙස දායක කරගැනීමට හැකි වේ.

දැරිය හැකි විශ්වාසනීයකල තිරසාර බලශක්තිය සියළු දෙනාටම ලැබීම සුරක්ෂිත කිරීම, තිරසාර සංවර්ධන ඉලක්කවල තවත් වැදගත් ඉලක්කයක් වේ. සියළු ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මූලික යෙදවුමක් වන බලශක්තිය ආර්ථික වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ. වැඩිවන බලශක්ති පරිභෝජනය තුළින් ඇති වන ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ඉමහත් වූව ද එලෙස වැඩිවන ඉල්ලුමට සරිලන ලෙස සැපයුම ලබා දීමේ දී ගැටළු රාශියකට මුහුණ දීමට සිදු වී ඇත. ජලවිදුලිය මඟින් බලශක්තිය ලබාදීම ලාභදායී වුවද ජල හිඟය හේතුවෙන් පොසිල ඉන්ධන වෙත නැඹුරුවීමට සිදු වී ඇත. එබැවින්, පොසිල ඉන්ධන වෙනුවට අඩු වියදම් හා පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිත කිරීම දිරිගැන්වීම සඳහා ගොඩනැගිලිවල වහළය මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති මඟින් විදුලිබලය උත්පාදනය සඳහා "වහළය මත සවි කරන ලද සූර්යය බලශක්ති උත්පාදනය කිරීමේ ණය ව්‍යාපෘතිය" 2019 වසරේ දී ආසියානු සංවර්ධන බැංකුවේ ණය යෝජනා ක්‍රමයක් ලෙස ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9,415 ක් (ඇ.ඩො. 50 ක්) මුදලක් ලැබුනු අතර එම මුළු මුදලම ව්‍යාපෘති කාලය අවසන් වීමටත් පෙර ණය ලාභීන් 5,449 දෙනෙක් වෙත ලබා දෙමින් මුළු ණය මුදලම ඉතා සාර්ථකව උපයෝජනය කර අවසන් කරන ලදී. එම ණය මුදලින් සියයට 48 ක ප්‍රතිශතයක් එනම් රු. මිලියන 4,588.67 ක ප්‍රමාණයක් වැඩිම විදුලි ඉල්ලුමක් සහිත දිස්ත්‍රික්ක තුනක් වන කොළඹ, යාපනය හා ගම්පහ දිස්ත්‍රික්ක අතර බෙදී ගොස් ඇති අතර ප්‍රදානිත ණය මුදලින් සියයට 71 ක පමණ ප්‍රතිශතයක් ගෘහාශ්‍රිත ණය වන අතර ඉතිරිය වාණිජ අරමුණින් යුත් ව්‍යාපාර සඳහා ලබා දී ඇත. තවද, මෙම ව්‍යාපෘතිය මඟින් මෙගා වොට් 70 අධික ප්‍රමාණයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට හැකියාව ලැබුනු අතර ව්‍යාපෘතියට ඇති අධික ඉල්ලුම හා පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය වඩාත් දිරිගැන්වීම සඳහා මෙහි දෙවන අදියර ලෙස ඇ.ඩො. 50 ක් 2022 වර්ෂයේ දී ලැබීමට නියමිතය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 21 | 13 | 8 |
| තෘතීයික | 01 | 01 | 0 |
| ද්විතීයික | 23 | 22 | 01 |
| ප්‍රාථමික | 12 | 12 | 0 |

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඇබෑර්තුවක් පවතින තනතුරෙහි රාජකාරි ආවරණ කටයුතු අනෙකුත් නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඩිජිටල් කරණය සඳහා දත්ත විශ්ලේශනය හා යෙදවුම් | 01 | දින 04 | | | දේශීය | පරිගනක පාදක යෙදවුම් භාවිතයෙන් SMEs සඳහා ආයෝජන තීරණ ගැනීම. |
| ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 01 | දින 02 | 10,000 | | දේශීය | ගිණුම්කරනය පිළිබඳ ප්‍රායෝගික භාවිතය පිළිබඳ මනා අවබෝධයක් ලබාගන්නා ලදී. |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 01 | දින 02 | 8,000 | | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | පිළිබඳ මනා අවබෝධයක් ලබාගන්නා ලදී. |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 01 | 5,000 | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව නව නීති රීති පිළිඳව දැනුවත් වන ලදී. |
| රජයේ වාහන නඩත්තුව | 01 | දින 1 | 5,000 | | දේශීය | වාහනයක් නිසිලෙස නඩත්තු කර පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් වන ලදි. |
| කා්රයාල කා්රය සහායක සේවයේ රාජකාරි පුහුණුව | 1 | දින 2 | 8,000 | | දේශීය | වඩා ඵලදායී ලෙස තම සේවය අදාළ සේවා ස්ථානයට ලබාදෙන්නේ කෙසේද යන්න පිළිබදව දැනුවත් වන ලදී. |
| රියදුරන්ගේ කුසලතා සංව්රධනය | 1 | දින 2 | 8,000 | | දේශීය | විෂය කරුණු යාවත්කාලීන කර ගැනීමට හැකි විය. |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කා්රයයන් අභිනියෝජනය කිරීම (මු. රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| **6.** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මු. රෙ. 134(2) DMA/1 -2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛන 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විදාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනයට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛනයේ සඳහන් කාලය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තුළ සිදුකොට තිබීම. | | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු. රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් වන විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු, වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10.** | **ගිණුම් කලමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | නිරවුල් කර තිබීම. | | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු. රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම. | | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු. රෙ. 176 හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති DMA චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනතාවගේ ප්‍රසංශා/චෝදනා පල කිරීමට පහසුකම් සලකා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/20/18 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20.** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |